**සැ. යු.** - 2018.04.27 වැනි දින පළ වූ අංක 2069 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,070 - 2018 මැයි මස 04 වැනි සිකුරාදා - 2018.05.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 654 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 655 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | — |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 657 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සැ. යු.** - සූතිකාධාර (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2018 අප්‍රේල් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 මැයි මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 මැයි මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

653 – B 081277 — 403 (2018/05)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2018 අංක 314

MOD/DEF/07/01/AVF/Ret/1025.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ස්වේච්ඡා උපසේවයට අන්තර්ග්‍රහණය කිරීම හා සක්‍රීය සේවයට කැඳවීමක්

**ස්වේච්ඡා උපසේවයට අන්තර්ග්‍රහණය කිරීම හා සක්‍රීය සේවයට කැඳවීම - ජාශිබ නිලධාරී**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2018 ජනවාරි මස 21 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ උපසේවයට අන්තර්ග්‍රහණය කර ශ්‍රී ලංකා යුද්ධ හමුද පොදු සේවා බලකාය වෙත ඇතුළත් කිරීම හා එදිනම සිට සක්‍රීය සේවයට කැඳවීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.

තාවකාලික කර්නල් මීගමුගේ සුනිල් ශාන්ත, ජාශිබ (නි/3131)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

05 - 86

---

2018 අංක 315

MOD/DEF/07/01/AVF/RET/1028.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2018 ජුනි මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් තෙන්නකෝන් මුදියන්සේලාගේ අජිත් දීපාල් සේනාරත්න, ශ්‍රීලංජාආබමු (නි/5593)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

05 - 83

---

2018 අංක 316

MOD/DEF/07/01/AVF/RET/1027.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීම**

පහත නම සඳහන් නිලධාරී 2018 ජූලි මස 17 වැනි දින සිට මේජර් නිලයේ නිල ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් හෙට්ටියා හන්දි සමන් පුෂ්ප කුමාර, ශ්‍රීලංජාආබමු (නි/5644)

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරී 2018 ජූලි මස 18 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් හෙට්ටියා හන්දි සමන් පුෂ්ප කුමාර, ශ්‍රීලංජාආබමු (නි/5644)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

05 - 85

2018 අංක 317

MOD/DEF/07/01/AVF/RET/1029.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරි 2018 ජනවාරි මස 17 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක - කාර්මික) යග්ගහ රූනගේ ආනන්ද, ශ්‍රීලයුවෙබ (නි/8482)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ක් වූ අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

05 - 84

2018 අංක 318

MOD/DEF/07/01/AVF/RET/1026.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරි 2018 ජූලි මස 22 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක - පොදු රාජකාරි) නංහාමිගේ ප්‍රේමතිලක, ශ්‍රීලංජාආබමු (නි/6512)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ක් වූ අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

05 - 87

# වෙනත් පත්කිරීම් ආදිය

2018 අංක 319

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

ගුවන් හමුදාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් නිළයට උසස් කෙරේ.

ෆ්ලයිං ඔෆිසර් ඉපලවත්තගේ චාමික ඉපලවත්තගේ (03115) පරි/රෙජි 2016.03.19

ෆ්ලයිං ඔෆිසර් පෙරුම්බුලි ආරච්චිගේ මෛත්‍රී විජයසේකර (03234) වෛද්‍ය 2016.11.28

ෆ්ලයිං ඔෆිසර් මාගගේ තරංග ලක්මාල් ප්‍රනාන්දු (03098) පරි/රෙජි 2017.01.01

ෆ්ලයිං ඔෆිසර් හීනටිගල පතිරණගේ රයන් තාරක පතිරණ (03386) සැපයුම් 2017.03.15

ෆ්ලයිං ඔෆිසර් ගොඩිගමුව ආචාරිගේ හර්ෂ සඳරුවන් ගොඩිගමුව (03222) විද්‍යුත් ඉංජි 2017.03.23

ෆ්ලයිං ඔෆිසර් බත්තන මුදියන්සේලාගේ හේෂිනී දනුෂ්කා කුමාරි අබේරත්න (OW/01091) සැපයුම් 2017.03.23

ෆ්ලයිං ඔෆිසර් හම්බන්ගේ දෝන පවිත්‍රා ප්‍රභාවී දයානන්ද (OW/01092) පරිපාලන 2017.03.23

ෆ්ලයිං ඔෆිසර් මූණදෙනිය එඬෙරගේ තාරුකා ස්වර්ණි නිෂාරා මූණදෙනිය (OW/01093) සැපයුම් 2017.03.23

ෆ්ලයිං ඔෆිසර් අධිකාරි ආරච්චිගේ මනුජ මධුෂාන් අධිකාරි (03223) පරිපාලන 2017.03.23

ෆ්ලයිං ඔෆිසර් වැලිකඩගේ සඳුන් ධනුෂ්ක බොතේජු (03225) පරි/නීති 2017.03.23

ෆ්ලයිං ඔෆිසර් කොඩිප්පිලිගේ හෂාන් ෂරිඳු කොඩිප්පිලිගේ (03227) විද්‍යුත්/ඉංජි 2017.03.23

ෆ්ලයිං ඔෆිසර් දිසානායකලාගේ බුද්ධික තියාක් එරංග දිසානායක (03228) පරිපාලන 2017.03.23

ෆ්ලයිං ඔෆිසර් පලාවත්ත මුදියන්සේලාගේ ෂමල් චතුරංග පලාවත්ත (03229) විද්‍යුත්/ඉංජි 2017.03.23

ෆ්ලයිං ඔෆිසර් ලොකු බඩතුරුගේ පුබුදිත් ගිම්හාන අරියදාස (03230) විද්‍යුත්/ඉංජි 2017.10.23

ෆ්ලයිං ඔෆිසර් විජේසූ ගමලත්ලාගේ ගිහාන් චතුරංග පොල්පිටිය (03231) පරි/නීති 2017.03.23

ෆ්ලයිං ඔෆිසර් හපුආරච්චිගේ සුමෝද කල්පික නවෝද්‍ය හපුආරච්චි (03232) පරිපාලන 2017.03.23

ෆ්ලයිං ඔෆිසර් රාජපක්ෂ මොහොට්ටි මුදියන්සේලාගේ ධනන්ජය අනුරුද්ධ බංඩාර රාජපක්ෂ (03360) පරිපාලන 2017.03.28

ෆ්ලයිං ඔෆිසර් ඒකනායක මුදියන්සේලාගේ චාමර සුරංග ඒකනායක (03361) පරිපාලන 2017.03.28

ෆ්ලයිං ඔෆිසර් ක්‍රිස්තෝම්බු ගුරුන්නාන්සේලාගේ සමීර චානක මිත්‍රානන්ද (03362) පරිපාලන 2017.03.28

ෆ්ලයිං ඔෆිසර් අමරසිංහගේ තරිඳු මධුශාන් (03058) නි.පො.රා. 2017.05.01

ෆ්ලයිං ඔෆිසර් විජේසේකර ගමාච්චිගේ ප්‍රගීත් චින්තක ඉෂාර විජේසේකර (03502) ගු.තො.නි. 2017.06.11

ෆ්ලයිං ඔෆිසර් සුරවීර ආරච්චිගේ කනිෂ්ක රශන්ත (03503) ගු.තො.නි. 2017.06.11

ෆ්ලයිං ඔෆිසර් ලද්දසිංහ සෙම්බුකුට්ටි ආරච්චිලාගේ අනුෂ්ක දිල්ශාන් ජයරත්න (02898) සැපයුම් 2017.07.10

ෆ්ලයිං ඔෆිසර් හාතියල්දෙනියේ රත්නායක මුදියන්සේලාගේ තුසිත රත්නායක (03369) ගු. තො. නි. 2017.07.11

ෆ්ලයිං ඔෆිසර් කුකුලෙ කංකානම්ගේ සමිත ඉන්දුල ආරියතිලක (03376) කාර්මික/ඉංජී 2017.07.18

ෆ්ලයිං ඔෆිසර් කරසිංහ ආරච්චිගේ සංජය චමිල කුමාර රත්නායක (03208) විද්‍යුත්/ඉංජී 2018.01.01

ෆ්ලයිං ඔෆිසර් බස්නායක මුදියන්සේලගේ සුමුදු ගයාන් බණ්ඩාර සියඹලන්ගමුව (03233) විද්‍යුත්/ඉංජී 2018.01.01

ෆ්ලයිං ඔෆිසර් හීපිටියේ ගෙදර නෙත්මිණ ජනක බණ්ඩාර දයානන්ද (03132) සැපයුම් 2018.01.01

ෆ්ලයිං ඔෆිසර් රාජපක්ෂ මොහොට්ටි මුදියන්සේලාගේ චතුරංග බණ්ඩාර අලුගොල්ල (03377) කාර්මික/ඉංජී 2018.01.01

(කේ. වී. බී. ජයම්පති)
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී,
ආර්එස්පී (සිව්වරක්), එෆ්එන්ඩීයු (චීනය),
කිව්එච්අයි. එයාර් මාර්ෂල්
ගුවන් හමුදාධිපති

2018 අප්‍රේල් මස 07 වැනි දින,
කොළඹ දී ය.

05 - 12/1

---

218 අංක 320

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

ගුවන් හමුදාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ෆ්ලයින් ඔෆිසර් නිළයට උසස් කෙරේ.

පයිලට් ඔෆිසර් අහංගමගේ ධනුක විදුනුවන් අහංගම (03547) නි.පො.රා. 2016.02.03

පයිලට් ඔෆිසර් කුලතුංග මුදියන්සේලාගේ දුෂාන්ත ලංකාපුර කුලතුංග (11980) නි.පො.රා 2016.03.17

පයිලට් ඔෆිසර් ඊරියඋල්ල රාළලාගේ නිමේෂ් මාරපන (11981) නි.පො.රා 2016.03.17

පයිලට් ඔෆිසර් ගොහුමුල්ලගේ දොන් අනුරංග ලක්මාල් ගොහුමුල්ල (11983) කාර්මික/ඉංජී 2016.03.17

පයිලට් ඔෆිසර් නිර්මාල් ධනුද්ධර හිරිපිටිය (11984) කාර්මික/ඉංජී 2016.03.17

පයිලට් ඔෆිසර් හිතනාදුර ඩිලාන් හංසකුමාර ජගත්සිංහ (11985) කාර්මික/ඉංජී 2016.03.17

පයිලට් ඔෆිසර් විජයතුංග මුදියන්සේලාගේ සංදීප කසුන් බණ්ඩාර විජයතුංග (11986) කාර්මික/ඉංජී 2016.03.17

පයිලට් ඔෆිසර් පුහුලෙගම දම්පතිගේ කල්ප ලක්මාල් ශ්‍රියාරත්න (11987) කාර්මික/ඉංජී 2016.03.17

පයිලට් ඔෆිසර් මුණසිංහ ආරච්චිගේ මලිත් සුදාරක මුණසිංහ (11988) කාර්මික/ඉංජී 2016.03.17

පයිලට් ඔෆිසර් හොලිපිටිගේ සසිඳු උදයසිරි ත්‍රීමාවිතාන (11989) කාර්මික/ඉංජී 2016.03.17

පයිලට් ඔෆිසර් සාවල් හර්ෂ සුහහන් (11990) කාර්මික/ඉංජී 2016.03.17

පයිලට් ඔෆිසර් අලුත්දුර පේඩිගේ ලහිරු මධුෂාන් විජේතුංග (11991) කාර්මික/ඉංජී 2016.03.17

පයිලට් ඔෆිසර් වරුස හැන්නැදිගේ හංස නිදුෂාන් ද සොයිසා (11992) විද්‍යුත්/ඉංජී 2016.03.17

පයිලට් ඔෆිසර් හේරත් මුදියන්සේලාගේ නලින් මධුසංක විජේබංඩාර (11993) විද්‍යුත්/ඉංජී 2016.03.17

පයිලට් ඔෆිසර් නුවන් සංජීව ඌරල ගමගේ (11994) විද්‍යුත්/ඉංජී 2016.03.17

පයිලට් ඔෆිසර් නිමේෂ අකිල කලටුආරච්චි (11995) විද්‍යුත්/ඉංජී 2016.03.17

පයිලට් ඔෆිසර් වික්‍රමසිංහ ආරච්චිලාගේ කවින්ද යෝෂන වික්‍රමසිංහ (11996) විද්‍යුත්/ඉංජී 2016.03.17

පයිලට් ඔෆිසර් හේවා වඩුගේ සුමුදු සඳරුවන් විජේරත්න (11997) විද්‍යුත්/ඉංජී 2016.03.17

පයිලට් ඔෆිසර් ඉඳුනෙත් සාලක මද්දුම කාංකානම්ගේ (12002) ගු.තො.නි 2016.03.17

පයිලට් ඔෆිසර් තිඹිරිපොලගේ ගයාන් දුමින්ද පීරිස් (12003) ගු.තො.නි 2016.03.17

පයිලට් ඔෆිසර් කුරුප්පුමුල්ලගේ දොන් සහම්පති රශීද පතිරත්න (12004) විද්‍යුත්/ඉංජී 2016.03.17

පයිලට් ඔෆිසර් ලියදිපිටිය දිසානායක මුදියන්සේලාගේ චතුර සංජීව (12005) විද්‍යුත්/ඉංජී 2016.03.17

පයිලට් ඔෆිසර් ඉඳුරුවේ ආචාරිගේ දොන් පියුමි මධුශානි පද්මකුමාර (LOC/00637) විද්‍යුත්/ඉංජී 2016.03.17

පයිලට් ඔෆිසර් සමරතුංග මුදියන්සේලාගේ සචිනි ලක්ෂිකා සමරතුංග (LOC/00638) විද්‍යුත්/ඉංජී 2016.03.17

පයිලට් ඔෆිසර් හිද්දදුර විෂාන් හර්ෂප්‍රිය ද සොයිසා (12009) කාර්මික/ඉංජි 2016.07.01
පයිලට් ඔෆිසර් මිල්ලව ගමගේ පසිදු සම්පත් සෙනෙවිරත්න (12010) කාර්මික/ඉංජි 2016.07.01
පයිලට් ඔෆිසර් සුහසිංහ ආරච්චිගේ දොන් චාමික රොෂාන් (12011) විද්‍යුත්/ඉංජි 2016.07.01
පයිලට් ඔෆිසර් ගජසිංහ මාරඹ ලියනගේ සංජය ගජසිංහ (12012) විද්‍යුත්/ඉංජි 2016.07.01
පයිලට් ඔෆිසර් බන්නැක මුදියන්සේලෑ වලව්වේ අඛිල චතුර්දි බණ්ඩාර වරාපිටිය (03688) සැපයුම් 2017.06.14

(කේ. වී. බී. ජයම්පති)
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී,
ආර්එස්පී (සිව්වරක්), එෆ්එන්ඩියු (චීනය), කිව්එච්අයි,
එයාර් මාර්ෂල්
ගුවන් හමුදාධිපති.

2018 අප්‍රේල් මස 07 වැනි දින,
කොළඹ දී ය.

05 - 12/2

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ (සංශෝධිත) 4 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාවයි

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2018 ක් වූ මාර්තු මස 20 වැනි දින පැවැත්වූ රැස්වීමක දී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

" මීගමුව දරන ස්ථානයේ ලීෂ්‍යා ඩිස්ට්‍රිබියුටර්ස් යන නාමය, විලාසය යටතේ සිය තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන තොටවත්ත බටගේ ඉෂාන් දයංග (ණයට ගන්නා) යන අය වෙත ප්‍රදානය කරන ලද ණය මුදල්/ මූල්‍ය පහසුකම් වෙනුවෙන් සුරැකුම් ලෙස ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. ජේ. විතානආරච්චි (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2017.06.13 දිනැති අංක 522 සහ අංක 524 දරන උකස් බැඳුම්කරයන් මගින් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) වෙත උකස් කොට සහ උකස් කරන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් හොඳින් විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය සම්බන්ධයෙන් වූ උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු මුදල් ගෙවීම ණයට ගන්නා විසින් පැහැර හැර ඇති හෙයින් ද,

තව ද එකී තොටවත්ත බටගේ ඉෂාන් දයංග විසින් පහත උපලේඛනයේ විස්තර කරන දේපළ සහ පරිශ්‍රය සඳහා වන සිය නිදහස් අයිතිවාසිකම්, හිමිකම් සහ බලපුළුවන්කාරකම් එකී අංක 522 සහ 524 දරන උකස් බැඳුම්කර යටතේ බැංකුවට උකස්කර ඇති හෙයින් ද,

තව ද වර්ෂ 2017 දෙසැම්බර් මස 31 වැනි දිනට එකී බැඳුම්කරය යටතේ බැංකුවට රුපියල් හතලිස් හතර මිලියන නවලක්ෂ හතලිස් හත්දහස් හාරසිය හතලිහයි ශත දාහතරක (රු. 44,947,440.14) මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද,

සංශෝධනය කරන ලද 1990 අංක 4 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (ප්‍රධාන පනත) යටතේ බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් හතලිස් හතර මිලියන නවලක්ෂ හතලිස් හත්දහස් හාරසිය හතලිහයි ශත දාහතරක (රු. 44,947,440.14) මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද වර්ෂ 2018 ජනවාරි මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා. -

i. එකී අංක 524 දරන උකස් බැඳුම්කරය යටතේ බැංකුවට හිඟව පවතින මුදල වන රුපියල් නවමිලියන පන්ලක්ෂ අසූතුන්දහස් තුන්සිය තිස්හතර (රු. 9,583,334.00) ක මුදල මත වසරකට සියයට දහඅටයි දශම හතයි පහ (18.75%) පොළියද,
ii. එකී අංක 522 දරන බැඳුම්කරය යටතේ බැංකුවට හිඟව පවතින මුදල වන රුපියල් මිලියන තිස් දෙකක (රු. 32,000,000.00) මුදල මත වසරකට සියයට විසිඅට (28%) පොළිය ද,

ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද, ප්‍රධාන පනතේ 13 වැනි වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම්ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එයද අඩු කර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කරය මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන අයි.ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට ප්‍රධාන

පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

**ඉහත සඳහන් උකස්කර ඇති දේපල පිළිබඳ විස්තරය**

01. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ දූනගහ හත්පත්තුවේ, අලුත්කුරු කෝරලේ, මීගමුව නගර සභා සීමාව තුළ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 75 කට්ටුව ග්‍රාම නිලධාරී වසමේ කට්ටුව නම් ගමේ, පල්ලසේන ෆාම් රෝඩ් හි පිහිටි ඩබ්ලිව්. එස්. එස්. පෙරේරා බලයලත් මානක විසින් සාදන ලද 1995.10.22 දිනැති අංක 3003 දරන පිඹුරෙහි දැක්වෙන අංක 11 දරන "කපුගහවත්ත" නම් වූ ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 නම් වූ ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : එම්. එස්. පෙරේරාගේ ඉඩම ද, නැගෙනහිරට : පල්ලසේන ෆාම් රෝඩ් සහ ලොට් අංක 02 න්ද, දකුණට : ලොට් 02 ද සහ බස්නාහිරට : ටී. ඒ. ප්‍රනාන්දුගේ ඉඩමෙන් තවත් කොටසක් වන ලොට් 01 නම් වූ ඉඩම් කැබැල්ල ද වන අතර ප්‍රමාණයෙන් පර්චස් දාහතරයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 14.75) ද වේ. මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 140/30 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇති අතර ඉඩම් මත පිහිටි සියලු දේද සමග වේ.

02. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දූනගහ හත්පත්තුවේ අලුත්කුරු කෝරලේ, මීගමුව නගර සභා සීමාව තුළ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 75 ග්‍රාම නිලධාරී වසමේ කට්ටුව නම් ගමේ, පල්ලසේන ෆාම් රෝඩ් හි පිහිටා ඇති එච්. එල්. සී. දාබරේරා බලයලත් මානක විසින් සාදන ලද 1995.12.11 දිනැති (පිඹුරු අංක 3003 හි දැක්වෙන ලොට් 2 හි අනුබෙදුමක් වූ) පිඹුරෙහි දැක්වෙන වරිපනම් අංක 11 දරන "කපුගහවත්ත" නම් වූ ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ලොට් 02A නම් වූ ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : මෙම පිඹුරෙහි ලොට් 01 ද, නැගෙනහිරට: පල්ලසේන ෆාම් රෝඩ් ද, දකුණට : මෙම පිඹුරෙහි ලොට් 02B ද සහ බස්නාහිරට : මෙම පිඹුරෙහි ලොට් 01 ද වන අතර ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම තුනයි හතයි පහ (අ. 0, රූ. 0, පර්. 07.375) ද වේ. මෙම ඉඩම එහි ඇති සියලුම දේද සමග වන අතර මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 140/31 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

03. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දූනගහ හත්පත්තුවේ, අලුත්කුරු කෝරලේ මීගමුව නගර සභා සීමාව තුළ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 75 ග්‍රාම නිලධාරී වසමේ කට්ටුව නම් ගමේ, පල්ලසේන ෆාම් රෝඩ් හි පිහිටා ඇති එච්. එල්. සී. දාබරේරා බලයලත් මානක විසින් සාදන ලද 1995.12.11 දිනැති (පිඹුරු අංක 3003 හි දැක්වෙන ලොට් 2 හි අනුබෙදුමක් වූ) පිඹුරෙහි දැක්වෙන වරිපනම් අංක 11 දරන "කපුගහවත්ත" නම් වූ ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ලොට් 02B නම් වූ ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : මෙම පිඹුරෙහි ලොට් 02A ද, නැගෙනහිරට : පල්ලසේන ෆාම් රෝඩ් ද, දකුණට : රොහාන් වර්ණකුලසූරියගේ ඉඩම ද සහ බස්නාහිරට : මෙම පිඹුරෙහි ලොට් 01 ද වන අතර ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම තුනයි හතයි පහ (අ. 0, රූ. 0, පර්. 07.375) ද වේ. මෙම ඉඩම එහි ඇති සියලුම දේද සමග වන අතර මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 140/32 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම මත ස්ථිර ලෙසම සවි කර ඇති හෝ තබා ඇති සහ කලින් කල ගෙන එනු ලබන සෑම සහ සියලු ආකාරයකටම නිශ්චල යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ, සවි කිරීම්, ඇමුණුම් සහ සේවා සමග වන අතර විදුලිය සැපයීමේ පද්ධති සහ උපකරණ, ජලය සැපයීමේ පද්ධති සහ උපකරණ, විදුලි සංදේශ, උපකරණ සහ වායු සමීකරණ උපකරණ ද ඇතුළුව වේ.

අධ්‍යක්ෂ මණ්ඩල නියෝගය පරිදි,

සමාගම් ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

05 - 45

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

සිටි ෆැෂන් ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0013 1001 2897

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2018.02.22 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඩී. බී. ගමගේ යන අය විසින් ලියා සහතික කරන ලද 2017 අගෝස්තු මස 15 දාතම හා අංක 2007 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ, පරිශ්‍රයන්වල අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් ලියාපදිංචි අංක PV 2592 දරන සමාගම් නීතීන් යටතේ නිසිලෙස සංස්ථාගත කොට ඇති සමාගමක් වන සිටි ෆැෂන් ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 2007 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් දෙකෝටි හැට දෙලක්ෂ අසූ එක් දහස් හත්සිය පහළොවයි ශත හයක (රු. 26,281,715.06) මුදලක් 2018 ජනවාරි මස 07 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දෙකෝටි හැට දෙලක්ෂ අසූ එක් දහස් හත්සිය පහළොවයි ශත හයක (රු. 26,281,715.06) මුදල ද, 2018

ජනවාරි මස 08 වැනි දින සිට අංක 2007 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙකෝටි පනස් ලක්ෂයක (රු. 25,000,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 2007 දරන එකී බැඳුම්කරය මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙනදේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ හෝමාගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සියඹලාගොඩ උතුර (ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 592) ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ සියඹලගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ සියඹලගොඩ පිහිටි මත්තේගොඩ පාර පොල්ගහඕවිට වරිපනම් අංක 301/14 දරන "කොරමිල්ලකනත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ඒ. ආර්. එස්. පෙරේරා යන අය විසින් සාදන ලද 2016 අගෝස්තු මස 15 දාතම හා අංක 6853 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2a වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : අංක 1071 දරන පිඹුරේ ලොට් 1, නැගෙනහිරට : මෙහි ලොට් 3a සහ 3b, දකුණට : මෙහි ලොට් 2b සහ බස්නාහිරට : අංක 5191 දරන පිඹුරේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි තුනයි දශම එකයි තුනක් (A: 0, R:0, P:23.13) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 6853 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව A 716/78 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. එකී සියඹලගොඩ පිහිටි මත්තේගොඩ පාර පොල්ගහඕවිට වරිපනම් අංක 291 දරන "කොරමිල්ලකනත්ත" යයි කියනු ලබන ඉඩමට අංක 6853 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 3a වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1071 දරන පිඹුරේ ලොට් 1, නැගෙනහිරට : පාර (මහ මාර්ගය), දකුණට : මෙහි ලොට් 3b සහ බස්නාහිරට : මෙහි ලොට් 2a යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ නමයයි දශම හතයි පහක් (A: 0, R:0, P:19.75) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 6853 දරන පිඹුරට අනුවය.

බලයලත් මානකතැන ඩබ්ලිව්. ඒ. ආර්. එස්. පෙරේරා යන අය විසින් සාදන ලද 2011 මැයි මස 26 දාතම හා අංක 4571 දරන පිඹුරේ නිරූපිත සර්ව සම ලොට් 3a හි නැවත මිනුමක් වන එකී පිඹුරු අංක 6853හි නිරූපිත එකී ලොට් 3a හි පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නිසි පිළිවෙලින් නැවත මිනුමකි.

එකී සියඹලගොඩ පිහිටි "කොරමිල්ලකනත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ඒ. ආර්. එස්. පෙරේරා යන අය විසින් සාදන ලද 2011 මැයි මස 28 දාතම හා අංක 4532 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 3a වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1071 දරන පිඹුරේ ලොට් 1, නැගෙනහිරට : පාර (මහ මාර්ගය), දකුණට : මෙහි ලොට් 3b සහ බස්නාහිරට : ලොට් 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ නමයයි දශම හතයි පහක් (A: 0, R:0, P:19.75) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 4532 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව A 705/34 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

3. එකී සියඹලගොඩ පිහිටි මත්තේගොඩ පාර පොල්ගහඕවිට වරිපනම් අංක 293 දරන "කොරමිල්ලකනත්ත" යයි කියනු ලබන ඉඩමට අංක 6853 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 3b වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට: මෙහි ලොට් 3a, නැගෙනහිරට : පාර (මහ මාර්ගය), දකුණට: පාර (අඩි 10 පළල) සහ බස්නාහිරට : මෙහි ලොට් 2a යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම එකයි පහක් (A: 0, R:0, P:8.15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 6853 දරන පිඹුරට අනුවය.

බලයලත් මානකතැන ඩබ්ලිව්. ඒ. ආර්. එස්. පෙරේරා යන අය විසින් සාදන ලද 2011 මැයි මස 26 දාතම හා අංක 4571 දරන පිඹුරේ නිරූපිත සර්ව සම ලොට් 3b හි නැවත මිනුමක් වන එකී පිඹුරු අංක 6853 හි නිරූපිත එකී ලොට් 3b පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නිසි පිළිවෙළින් නැවත මිනුමකි.

එකී සියඹලගොඩ පිහිටි "කොරමිල්ලකනත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ඒ. ආර්. එස්. පෙරේරා යන අය විසින් සාදන ලද 2011 මැයි මස 28 දාතම හා අංක 4532 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 3b වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 3a , නැගෙනහිරට: පාර (මහ මාර්ගය) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම එකයි පහක් (A: 0, R:0, P:8.15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 4532 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව A 705/97 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 4571 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 3d සහ 2016 අගෝස්තු මස 15 දාතම හා අංක 6853 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 2b වශයෙන් ලකුණුකොට ඇති මාර්ග වෙන්කිරීම් දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05 - 100

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

*සැළකිය යුතුයි.* - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2018** | | | |
| **මැයි** | 2018.05.04 | සිකුරාදා | 2018.04.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.05.11 | සිකුරාදා | 2018.04.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.05.18 | සිකුරාදා | 2018.05.04 | සිකුරාද | දහවල් | 12.00 |
| | 2018.05.25 | සිකුරාද | 2018.05.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජුනි** | 2018.06.01 | සිකුරාදා | 2018.05.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.06.08 | සිකුරාදා | 2018.05.25 | සිකුරාද | දහවල් | 12.00 |
| | 2018.06.14 | බ්‍රහස්පතින්ද | 2018.06.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.06.22 | සිකුරාදා | 2018.06.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.06.29 | සිකුරාදා | 2018.06.14 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **ජුලි** | 2018.07.06 | සිකුරාදා | 2018.06.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.07.13 | සිකුරාදා | 2018.06.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.07.20 | සිකුරාදා | 2018.07.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.07.26 | බ්‍රහස්පතින්දා | 2018.07.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.